# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

## පුරප්පාඩු

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අනුබද්ධිත හා 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් ස්ථාපිත ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා පවතින පුරප්පාඩු වෙනුවෙන් ඒ යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතරින් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

**01.** **ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි - තනතුරු 01**

1. **වැටුප් කේතය - JM 1-1 – 2016**
2. **වැටුප් පරිමාණය -** රු. 42600/-10x755-18x1135-70580/-

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව බඳවා ගැනීමේදී මූලික වැටුප රු.42600/-ක් වේ)

3. **සුදුසුකම්**

**3.1 බාහිර අයදුම්කරුවන් සඳහා**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.
- රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු සම්බන්ධව සේවය කර ඇති නිලධාරීන්ට ප්‍රමුඛතාවය ලබා දේ.

**වයස** - අවුරුදු 22 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**3.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

සහ

02. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරක "කළමනාකරණ සහකාර"සේවා ගණයේ II වන ශ්‍රේණියේ වසර (05) ක පළපුරුද්ද.

4. **බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**02. තොරතුරු තාක්ෂණ නිලධාරි - තනතුරු 01**

**1.** **වැටුප් කේතය** **-** JM 1-1 – 2016

**2.** **වැටුප් පරිමාණය -** රු. 42600/-10x755-18x1135-70580/-

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව බඳවා ගැනීමේදී මූලික වැටුප රු.42600/-ක් වේ)

**3. සුදුසුකම්**

**3.1 බාහිර සුදුසුකම්**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම. තොරතුරු තාක්ෂණ උපාධිධාරින්ට/ තොරතුරු තාක්ෂණය විෂයක් ලෙස හදාරා ඇති අයදුම්කරුවන්ට ඉහළ ප්‍රමුඛතාව ලබා දේ.
- රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක තොරතුරු තාක්ෂණික කටයුතු පිළිබඳව සේවය කර ඇති නිලධාරීන්ට ප්‍රමුඛතාවය ලබා දේ.

**වයසස** **-** අවුරුදු 22 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**3.2 අභ්‍යන්තර සුදුසුකම්**

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

සහ

02. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරක "කළමනාකරණ සහකාර"සේවා ගණයේ II වන ශ්‍රේණියේ වසර (05) ක පළපුරුද්ද.

**4. බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**03. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) : තනතුරු 05**

**1. සේවා ගණය :** කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)

**2.** **වැටුප් කාණ්ඩය :** MA 1-1

**3.** **වැටුප් පරිමාණය :** රු.27,910 – 10x300-7x350-4x495-20x660 - රු.48,540/-

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව බඳවා ගැනීමේදී මූලික වැටුප රු.27,910/-ක් වේ)

**4. සුදුසුකම්**

**4.1 බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් 06කින් සමත්ව තිබීම, සහ

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් (03)ක් සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**4.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම්**

ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැක.

I. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් 06කින් සමත්ව තිබීම, සහ

II. සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය

III. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**5. බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වයස් සීමාව**

අයදුම්කරුවන් වයස අවු 18 ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් සුදුසුකම්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**සේවා නියුක්ත කරවීමේ කොන්දේසි**

පත්වීම ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**අයදුම් කිරීමේ ක්‍රමය**

මෙම නිවේදනය අග යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනය ගනිමින් අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද, ඉතිරිය අනෙක් පිටුවලටද වන ලෙස සකස් කළ අයදුම්පතක් සම්පූර්ණ කර අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් සනාථ කළ හැකි පිටපත් සමඟ අයදුම්පත් යොමු කළ යුතු වේ. තවද, දැනටමත් රජයේ සංස්ථා / මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කර 2024.05.30 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් ලැබීමට සැලැස්විය යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසු ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ඉහත බඳවා ගැනීම සිදු කෙරේ.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පාලක මණ්ඩලය සතු වේ.


දුරකථන අංකය - 0112 786541
ඊ මේල් nilsprocurementunit@gmail.com
වෙබ් අඩවිය www.nils.gov.lk

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
2 වන මහල
කම්කරු මහලේකම් කාර්යාලය
කොළඹ 05